# නුවර කලාවියේ ජනජීවිතය හා බැඳුණු යාතුකර්ම, අභිචාර විධි හා කෙම්පහන් ක්‍රම පිළිබඳ ඓතිහාසික විමසුමක්

විල්ගමුවේ පියනන්ද හිමි

උපශාලාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය
wilpiyananda@gmail.com 0714463017

## හැඳින්වීම

ලෝකයේ බොහෝ රාජ්‍යයන්හී යාතුකර්ම, අභිචාර විධි හා කෙම්පහන් ක්‍රම ඔවුන්ගේ සංස්කෘතීන්ට අනුව එම පිරිස් ජනාවාස වීම සිදු වූ දා පටන් ඔවුන් විසින් ම ගොඩනගන ලද විවිධ ආගමික විශ්වාසයන් හා ඇදහිලි මූලික කොට ගෙන ආරම්භ ව ව්‍යාප්ත වී ඇත. යාතුකර්ම යනු බලි, තොවිල්, පිදේනි, බන්ධන කැපීම් ආදිය හා බැඳුනු ශාන්ති කර්මයි. අභිචාර විධි යනු යාතුකර්ම හා බැඳි පුදපූජා විධීන් සහ මන්ත්‍ර ආදියයි. කෙම්පහන් ක්‍රම යනු රහසිගත ව කිසියම් රෝගයකට පිළියමක් වශයෙන් සිදුකරනු ලබන ගුප්ත ක්‍රියාදාමයන් ය. ශ්‍රී ලංකාවෙහි ද විජයාගමනයටත් පෙර පටන් ම මෙ වැනි පුදසිරිත් පැවති බවට විශ්වාස කෙරේ. රාමායනයෙහි දැක්වෙන 'ලංකාපුරය' ඇතැමුන් පෙන්වා දෙන ආකාරයට එය ශ්‍රී ලංකාව නම් ක්‍රි. පූ. 4000ටත් පෙර විසූ රාවණා රජු ද යන්ත්‍ර මන්ත්‍ර භාවිත කොට මෙරට වික්‍රමයන් පෑ බව එම ග්‍රන්ථයෙහි සිදහන් වෙයි. එ සේ ම විජය ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට එන ගමනේ දී පිරිත් නූල් බැඳ පැමිණි බව **මහාවංසයෙහ** සිදහන් වෙයි. බුදුන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩමවීමේ පුවත් වලින් ද පැහැදිලි වන්නේ විවිධ ගෝත්‍රිකයන් මෙරට විසූ බවත් ඔවුන් තුළ විවිධ අභිසමාචාර විධි පැවති බවත් ය.

ඒ අනුව අනාදිමත් කාලයක සිට නුවර කලාවියෙහි ජනයා පමණක් නොව ශ්‍රී ලංකාවෙහි සෙසු ප්‍රදේශයන්හි ජනයා ද එම ප්‍රදේශයන්හි ජීවත්වන පිරිසගේ සංස්කෘතිය හා ජීවන රටාව මූලික කොට ඔවුනට ඇතිවන අභියෝගයන් ජය ගැනීමටත්, ආරක්ෂාව ඇතිකර ගැනීම සිදහාත් යාතුකර්ම, අභිචාර විධි හා කෙම්පහන් ක්‍රමවල පිහිට පතා තිබේ. අප මෙහි දී අධ්‍යයනය කරනුයේ අනුරාධපුර යුගයේ මුල් අවධියෙහි සිට පැවත එන අදටත් නුවර කලාවියට ම ආවේනික ව දක්නට ලැබෙන ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධකවලින් තහවුරුවන යාතුකර්ම, අභිචාර විධි හා කෙම්පහන් ක්‍රම පිළිබිඳවයි.

නුවර කලාවියේ ගැමි සමාජය වැව මූලික කොට ජීවත් වූ කෘෂිකාර්මික ජීවන රටාවකට හිමිකම් කියන ජන කණ්ඩායමකි. පරිසරය මූලික කොට ජිවත්වන එම පිරිසට තම ජීවන රටාවට එල්ලවන විවිධ වූ අභියෝග ඔ නම් දෙවියන්ගෙන් ඇතිවන කරදර නැතිකර ගැනීම හා දෙවියන්ගෙන් පිහිට පැතීම, කලට වැසි නොලැබීම, කෙත්වතු පාළු වීම, රෝගිය ඇති වීම හා පැතිරීම, සතුරු කරදර හා අපල උපද්‍රව දුරුකර ගැනීම, විරුද්ධ වාදීකම්වලට මෙන් ම හොර සතුරන්ට නිසි දඬුවම් දීම ආදි එදිනෙදා ඇතිවන අභියෝගයන්ට ප්‍රතිකර්ම කිරීමත් ආරක්ෂාව පැතීමත් නුවර කලාවියේ ජනයා සිදු කරගත්තේ යාතුකර්ම, අභිචාරවිධි හා කෙම්පහන් ක්‍රම භාවිත කිරීමෙන් ය. ඒ අනුව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක සහිත ව එහි විකාශය පිළිබිඳ කරුණු දැක්වීමටත්, එ සේ විකාශය වූ නුවර කලාවියේ ජනජීවිතය හා බැඳි යාතුකර්ම, අභිචාරවිධි හා කෙම්පහන් ක්‍රම විධීන්ගේ වර්තමාන ස්වරූපය අධ්‍යයනය කිරිමටත් මෙහි දී අපේක්ෂිත ය.

## පර්යේෂණ ක්‍රම වේදය

වර්තමානයෙහි දක්නට ඇති රජරට, නුවර කලාවියේ ජනජීවිතය හා බැඳුණු යාතුකර්ම,

අභිචාර විධි හා කෙම්පහන් ක්‍රම එම ප්‍රදේශයෙහි ජනතාවගේ ජන විශ්වාසයන් හා ජනශ්‍රැතීන් අනුව මැනවින් අධ්‍යයනය කොට එහි ඓතිහාසික වැදගත්කම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඔස්සේ විමර්ශනය කිරීම.

### නුවර කලාවියේ ජනජීවිතය හා බැඳුණු යාතුකර්ම, අභිචාර විධි හා කෙම්පහන් ක්‍රම පිළිබඳ විමර්ශනය

මෙ රට මහින්දාගමනයට පෙර සහ පසුව පැවති බ්‍රාහ්මණ ආගම ප්‍රධාන කොට ඇති ශිව, ජෛන, පරිබ්‍රාජක, ආජීවක, තාපස වැනි ශ්‍රමණ සාම්ප්‍රදායික ඉගැන්වීම් ද යක්ෂ, දේව, නාග, වෘක්ෂ, තාරකා, චන්ද්‍ර, සූර්ය, වැනි වන්දනයන් ද සිදුකළ ජනතාව සිටි බව **මහාවංශයෙහ** දැක් වේ. එ සේ ම එවැනි වන්දනාමාන ක්‍රම පැවති බවට පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තුළින් ද සනාථ වී තිබේ. මහින්දාගමනයෙන් පසු ඉහත සිදහන් ඇදහිලි හා විශ්වාසයන්ට බෞද්ධාගමික මුහුණුවරක් එකතු කළ ද එම ආගමික ඇදහිලි හා විශ්වාස සහමුලින් නැති කිරීමට හෝ ඒවා බෞද්ධාගමික මුහුණුවරකට පත්කිරීමට හැකියාවක් ලැබී නැත. එ සේ වී තිබෙනුයේ අතීතයේ සිට විවිධ ආගම් ඇදහීමේ නිදහස අප රටෙහි පැවතීම නිසාවෙනි.

බුදුදහම මෙ රටට ලැබී කලක් ගතවීමෙන් පසු ඇති වූ නිකාය භේදය හේතුවෙන් 'වජ්‍රයානය, තන්ත්‍රයානය' වැනි මහායාන නිකායන් නිසා ද මන්ත්‍ර ආදී අභිචාරවිධි සංවර්ධනය වී බෞද්ධාගමික මුහුනුවරින් ජනතාව වෙත සමීප වී ඇත. ඉසුරුමුණිය සමීපයෙහි ඇති යන්ත්‍ර ගල ද මෙ වැනි ඇදහිලි පැවති බවට ඇති පුරාවිද්‍යාත්මක සාධකයකි. මෙ සේ වසර දහසකට අධික ව යුගයක් වශයෙන් සංවර්ධනය වී පැවතුණු අනුරාධපුර රාජධානිය විවිධ ආගමික පුදසිරිත් හා විශ්වාසයන්ගෙන් ද සංවර්ධනය වී ඇති බවට නුවර කලාවියෙහි ඇති යාතුකර්ම සහ අභිචාර විධි කදිම සාධකයන් ලෙස පෙන්වා දිය හැකි ය. රාජධානි වශයෙන් පසු කාලයෙහි මෙ රට පාලන ඉතිහාසය වෙනස් වුව ද නුවර කලාවියෙහි ජනයා මහත් ගෞරවයෙන් හා විශ්වාසයෙන් ඉපැරණි ව පැවතගෙන ආ යාතුකර්ම හා අභිචාරවිධි මනා ව ආරක්ෂා කරමින්, සංවර්ධනය කරමින් පැමිණ ඇති බව එම ප්‍රදේශයන්හි ජනතාවගේ ජන විශ්වාසයන් හා ජනශ්‍රැතීන් විමර්ශනය කරන විට මනාව පැහැදිලි වෙයි.

නුවර කලාවියෙහි ජනයා වැව මූලික කොටගත් එම පරිසරයට මැනවින් ආදරය කළ මානව හිතවාදී ජන කණ්ඩායමකි. ඔවුන්ගේ මුළු ජීවිත කාලය ම පරිසරය හා බද්ධ ව ගෙවී තිබේ. එහි දී කෘෂිකර්මාන්තය, පශු කර්මාන්තය හා එදිනෙදා භාවිත සියලු සම්පත්වල දියුණුව සහ ඔවුන්ගේ ආරක්ෂාව සපයා ගැනීම පිණිස යාතුකර්ම, අභිචාරවිධි හා කෙම්පහන් ක්‍රම භාවිත කොට ඇත. යාතුකර්ම කායික මානසික ව්‍යාධිය හා භූත දෝෂ වැනි දේ දුරු කරගැනීම පිණිස භාවිත කළ බවට සාධක හමු වේ. ඒ සිදහා 'නවග්‍රහබලි', 'මල්බලි' හා 'ගුරුළු රාක්ෂ බලි' ආදී වූ බලි ද 'කුකුළුබිලි' ආදී වූ බිලි වර්ග ද 'අයියනායක' දෙවියන් උදෙසා කරන 'මුට්ටි නැමීම' කඩවර වැනි යකුන්ට සිදුකරන 'බත්මාලාව' වැනි පූජාවන් ද අයත් ය. එම යාතු කර්ම සිදුකරන පිළිවෙල හා මන්ත්‍ර අභිචාර ලෙස ගැනෙයි. එහි සිදහන් මන්ත්‍ර ආරක්ෂාව හා සතුරන් මර්දනය පිණිස භාවිත කරන ලද ඒවා ය. ඒවා කෙටි හා දීර්ඝ මන්ත්‍ර වන අතර එහි බස පැරණි සිංහල භාෂාව ලෙස හිඳුනාගත හැකි ය. ඇතැම් මන්ත්‍ර ද්‍රවිඩ භාෂාවෙන් ද පවතින බව පෙනේ. ආරක්ෂක කෙම්ක්‍රම ද නුවර කලාවියෙහි පමණක් දැකිය හැකි එයට අනන්‍ය වුවක් ලෙස හිඳුනාගත හැකි ය. ආරක්ෂක කෙම් ක්‍රම, සතුරන් මර්දන කෙම් ක්‍රම, කෘෂි ආරක්ෂක කෙම් ක්‍රම, පශු ආරක්ෂක කෙම් ක්‍රම ආදි වශයෙන් කෙම් ක්‍රම ගණනාවක් හිඳුනාගත හැකි ය. නුවර කලාවියෙහි ජනයා අනාදිමත් කාලයක සිට තම ජීවිත සුඛිත මුදිත ව පවත්වාගෙන එන ලද්දේ මෙම යාතුකර්ම, අභිචාරවිධි හා කෙම්පහන් ක්‍රම මැනවින් භාවිත කිරීමෙන් බවට ඔවුන් තුළ විශ්වාසයක් පවතී. නූතනයෙහි ද එම ප්‍රදේශයන්හි ජනතාව මේවා මැනවින් විශ්වාස කරන අතර වැඩිහිටියන් බාල පරපුරට ඒ සිදහා අවශ්‍ය මඟ කියමින් පුහුණුව ඇති කිරීම ද මෙහි දී අගය කළ යුත්තකි.

### නිගමනය

විජයාගමනයෙන් පෙර සහ පසුව රජරට නුවර කලාවියෙහි ජනයා කායික මානසික ව්‍යාධීන් දුරුකර ගැනීම සඳහා විවිධ විශ්වාස

මත ගොඩනගාගත් බලි, තොවිල්, යන්ත්‍ර, මන්ත්‍ර ආදී යාතුකර්ම හා අභිචාරවිධි ද කෙම්පහන් ක්‍රම ද ඔවුන්ට අනන්‍ය වූ ක්‍රමවේදයකින් අනාදිමත් කාලයක සිට පවත්වා ගෙන පැමිණ තිබේ. එ සේ ම එම ශාන්ති කර්ම වර්තමානය දක්වා කෘෂිකර්මාන්තයෙහි හා පශු කර්මාන්තයෙහි දියුණුවටත්, ආරක්ෂාවටත් එදිනෙදා ජීවිතයෙහි ඇතිවන විවිධ අභියෝග සහ සතුරු කරදර ජය ගැනීමටත් භාවිත කොට බොහෝ අපේක්ෂා ඉටුකරගෙන ඇති බව සියලු සාධක මත මෙහිදී බැසගත හැකි නිගමනයයි.

### ආශ්‍රය ග්‍රන්ථ


මහාවංසය, (ප්‍රථම භාගය), 1996, (සංස්) හික්කඩුවේ සුමංගල හිමි, බටුවන්තුඩුවේ පිඩිතුමා, ගංගොඩවිල: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ශිලාලේඛන සංග්‍රහය, 1 වෙළුම. 2000, (සංස්) ඩී. එම්.එස්. වික්‍රමසිංහ, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.